**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව**
**வளிமண்டலவியல் திணைக்களம்**
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

## ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය
## GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

**2024 නොවැම්බර් මස 27 දිනය සඳහා කාලගුණ අනාවැකිය**
**2024 නොවැම්බර් මස 26 දින මධ්‍යහන 12.00 ට නිකුත්කරන ලදි.**

**නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති පීඩන අවපාතය නොවැම්බර් මස 26 දින උදෑසන 11:00 පමණ වනවිට මඩකලපුව සිට කි.මී. 170 ක් සහ ත්‍රිකුණාමලයට කි.මී. 240 ක් පමන එපිටින් ගිණිකොන දෙසින් පිහිටා තිබුණි. එය ඉදිරි පැය 12 තුළදී වයඹ දෙසට ගමන් කර ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් දිවයිනේ නැගෙනහිර වෙරළට ඉතා ආසන්නව ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ. මෙම පද්ධතියේ බලපෑම හේතුවෙන් දිවයින පුරා බොහෝ ප්‍රදේශවල අහස වලාකුළින් බරව පවතින අතර උතුරු, නැගෙනහිර, ඌව, වයඹ සහ මධ්‍යම පළාත් වලට ඉතා තද වැසි සහ තද සුළං අපේක්ෂා කරයි.**

හෙට දිනයේදී දිවයිනේ බොහෝ ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත ඇති වේ.උතුරු, උතුරු-මැද, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේත් ඇතැම් ස්ථානවලට **මි.මී.150 ට වැඩි ඉතා** තද වැසි ඇතිවිය හැක.

දිවයිනේ සෙසු ප්‍රදේශවලත් ඇතැම් ස්ථානවලට **මි.මී.100 ක පමණ** තද වැසි ඇතිවිය හැක.

උතුරු, උතුරුමැද , මධ්‍යම, වයඹ සහ නැගෙනහිර පළාත්වලත් හම්බන්තොට දිස්ත්‍රික්කයෙත් විටින් විට හමන පැ.කි.මී. (40-50) ක පමණ **තද සුළං** ඇතිවිය හැක.

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මඟින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

**WEATHER FORECAST FOR 27 NOVEMBER 2024**
**Issued at 12.00 noon on 26 November 2024**

**The Depression over Southwest Bay of Bengal was located to southeast about 170km of Batticaloa and 240 km of Trincomalee at around 11:00 a.m. of 26th November 2024. The system is likely to move northwestwards and intensify into a deep depression during next 12 hours and move very closer to the east coast of the island. Cloudy skies are expected over most parts of the island and due to the influence of this system and very heavy showers and strong winds can be expected in Northern, Eastern, Uva and Central provinces.**

Showers or thundershowers will occur at times in most places of the island. Very heavy showers **above 150 mm** are likely at some places in Northern, North-central, Central and North-western provinces and in Trincomalee district tomorrow.

Heavy showers about **100 mm** are likely at several places elsewhere of the island.

Strong winds of about (40-50) kmph can be expected at times over Northern, North-central, Central, North-western and Eastern provinces and in Hambantota district.

**The general public is kindly requested to take adequate precautions minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි

Issued by Forecasting Division, National Meteorological Centre

**ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය**
**2024 නොවැම්බර් මස 26 දින මධ්‍යහන 12.00 ට නිකුත් කරන ලදි.**

| |
|---|
| **නිරිත දිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පැවති පීඩන අවපාතය නොවැම්බර් මස 26 දින උදෑසන 11:00 පමණ වනවිට මඩකලපුව සිට කි.මී. 170 ක් සහ ත්‍රිකුණාමලයට කි.මී. 240 ක් පමන එපිටින් ගිණිකොන දෙසින් පිහිටා තිබුණි. එය ඉදිරි පැය 12 තුළදී වයඹ දෙසට ගමන් කර ගැඹුරු පීඩන අවපාතයක් දක්වා වර්ධනය වෙමින් දිවයිනේ නැගෙනහිර වෙරළට ඉතා ආසන්නව ගමන් කරනු ඇතැයි බලාපොරොත්තු වේ. නැවත දැනුම් දෙනතුරු දිවයින වටාවන ගැඹුරු සහ නොගැඹුරු මුහුදු ප්‍රදේශවල ධීවර සහ නාවුක කටයුතුවලින් වැළකී සිටින ලෙස දැනුම් දෙනු ලැබේ.** |
| **වැසි තත්ත්වය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. |
| **සුළඟ:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං ඊසාන දිශාවෙන් හමා එන අතර සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වන අතර සුළගේ වේගය ක්ෂණිකව **පැ.කි.මී. (60-70)** පමණ දක්වා ඉහළ යා හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| දිවයින වටා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු විය හැක.<br>මඩකලපුව සිට ත්‍රිකුණාමලය හරහා කන්කසන්තුරය දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල මුහුදු රළ උස මීටර් (2.5 – 3.0) ක් පමණ ඉහළ යාමේ හැකියාවක් පවතී. (මෙය ගොඩබිමට එන රළ උස නොවේ)<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 12.00 noon on 26 November 2024.**

| |
|---|
| **The Depression over Southwest Bay of Bengal was located to southeast about 170km of Batticaloa and 240 km of Trincomalee at around 11:00 a.m. of 26th November 2024. The system is likely to move northwestwards and intensify into a deep depression during next 12 hours and move very closer to the east coast of the island.**<br>**Naval and fishing communities are warned not to venture to the deep and shallow sea areas around the island until further notice.** |
| **Condition of Rain:** |
| Showers or thundershowers will occur at times in the sea areas around the island. |
| **Winds:** |
| Winds will be north-easterly in direction in the sea areas around the island. Wind speed will be (40-50) kmph and Wind speed can increase up to **(60-70) kmph** at times in the sea areas around the island. |
| **State of Sea:** |
| The sea areas around the island will be rough to very rough at times.<br>The swell waves (about 2.5–3.0 m) height (this is not for land area) may increase in the sea areas off the coast extending from Batticaloa to Kankasanthurai via Trincomalee.<br>**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers.** |

Rainfall amount (mm): Light: 00-12.5, Light to moderate: 12.5-25, Moderate: 25-50, Fairly heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.5, සිහින් හෝ මද වැසි: 12.5-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි